# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/33 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 5/2011(ii)

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 වන සහ 14 වන වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 89 වන වගන්තිය යටතේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු,
මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය.

2020 පෙබරවාරි මස 20 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2020 අංක 1 දරන ජාතික මංමාවත් (භාවිත කිරීමේ ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග -

(*අ*) 2020 පෙබරවාරි මස 20 වැනි දින අංක 2163/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු දක්ෂිණ ජාතික මහා මාර්ගය (කොට්ටාව - මත්තල)";

(*ආ*) 2019 නොවැම්බර් මස 08 වැනි දින අංක 2148/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු අන්දරවැව - හම්බන්තොට ජාතික මහාමාර්ගය";

(*ඇ*) 2019 නොවැම්බර් මස 08 වැනි දින අංක 2148/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු පිටත වටරවුම් ජාතික මහාමාර්ගය" ; සහ

(*ඈ*) 2013 ඔක්තෝබර් මස 12 වන දින අංක 1831/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු කොළඹ - කටුනායක ජාතික මහා මාර්ගය";

සම්බන්ධයෙන් අදාළ වේ.

3. (1) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග භාවිත කරන සෑම වාහනයක රියැදුරකු විසින් ම ඒ මහා මාර්ගය භාවිත කිරීම සම්බන්ධයෙන් මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ පරිදි ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

(2) ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් එම ගාස්තුව අයකරගනු ලැබිය යුතු ය.

(3) විවිධ වර්ගවලට අයත් වාහන සඳහා විවිධ ගාස්තු නියම කරනු ලැබිය යුතු ය.

(4) ගාස්තුව -

(*අ*) අතින්, මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය ; හෝ

(*ආ*) වාහනයට සම්බන්ධ කර ඇති (මෙහි මින්මතු "ඊ-ටැග්" (E-tag) යනුවෙන් හඳුන්වනු ලබන) උපාංගයක් මගින් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගෙවනු ලැබිය යුතු ය.

4. (1) නම් කරන ලද ස්ථානයකින් හැර යම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවීමේ මහා මාර්ගයට ප්‍රවේශ වන ඊ-ටැග් භාවිතා නොකරන රියැදුරකු විසින් ගාස්තු ගෙවිය යුතු මහා මාර්ගයේ ගමන් කිරීමට අවසර ලබාදීමට පෙරාතුව ඒ අන්තර් හුවමාරුවේ සේවයේ යෙදී සිටින අයකැමිගෙන් ප්‍රවේශ පත්‍රයක් ලබා ගත යුතු ය.

(2) 4 (1) වන නියෝගය යටතේ ප්‍රවේශ පත්‍රයක් ලබා ගෙන ඇති සෑම රියැදුරකු ම එම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයෙන් පිටවීම සඳහා ඔහු අපේක්ෂා කරන අන්තර් හුවමාරුවේ හෝ නම් කරන ලද ස්ථානයේ ගාස්තු ගෙවීමේ ස්ථානයට ළඟාවන තෙක් එම ප්‍රවේශ පත්‍රය ඔහුගේ සන්තකයේ සුරක්ෂිතව තබාගත යුතු ය.

(3) ගාස්තු ගෙවීමේ ජාතික මහා මාර්ගයෙන් පිටව යෑමේ අරමුණින් පැමිණෙන යම් වාහනයක රියැදුරකු විසින්, ඒ රියැදුරා විසින් පසුකර යා යුතු අන්තර් හුවමාරුවේ හෝ නම් කරන ලද ස්ථානයේ ගාස්තු ගෙවීමේ ස්ථානයකට පැමිණි විට, එම වාහනයේ රියැදුරු විසින් -

(*අ*) ඔහු ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වීමේ දී අන්තර් හුවමාරුවෙන් ලබා ගත් ප්‍රවේශ පත්‍රය අයකැමි යටතට පත්කළ යුතු ය ; හෝ

(*ආ*) ඔහු ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වූයේ නම් කරන ලද ස්ථානයකින් නම්, ඒ නම් කරන ලද ස්ථානය, අයකැමි වෙත දැනුම් දිය යුතු ය.

(4) අතින් මුදල් වශයෙන් ගාස්තු එකතු කරන මංතීරුව භාවිතා කරන වාහන සඳහා ගෙවිය යුතු ගාස්තුව අයකැමි විසින් රියැදුරු වෙත දැනුම් දිය යුතු අතර, ඒ අනුව අන්තර් හුවමාරුවෙන් හෝ නම් කරන ලද ස්ථානයෙන් පිටවී යෑමට අවසර ලබාදීමට ප්‍රථමයෙන් රියැදුරු විසින් ඒ මුදල ගෙවිය යුතු අතර, අයකැමි විසින් ඒ ගෙවීම වෙනුවෙන් ලදු පතක් නිකුත් කළ යුතු ය.

(5) රියැදුරු විසින් -

(*අ*) ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී ; හෝ

(*ආ*) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වූ නම් කරන ලද ස්ථානය හඳුනා ගැනීමට නොහැකි වන අවස්ථාවක දී,

ජාතික මහා මාර්ගයේ වඩාත්ම දුරින් පිහිටි ප්‍රවේශයේ සිට සැබැවින්ම පිට වූ ස්ථානය දක්වා වූ සම්පූර්ණ දුර ප්‍රමාණය සඳහා ඔහු විසින් ගාස්තු ගෙවිය යුතු අතර, ඒ සඳහා මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත වූ ගාස්තුවක් අයකරගනු ලැබිය යුතු ය.

5. (1) (මෙහි මින්මතු ඊ-ටැග් භාවිත කරන්නා" (E-tag user) යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගෙවීම් කිරීමට කැමැත්ත දක්වන යම් වාහනයක අයිතිකරුවකු හෝ රියදුරකු විසින් (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවා ඇති මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි විය යුතු අතර, අධිකාරියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙහි ඇති (මෙහි මින්මතු "ඊටීසීඑස් ගිණුම" (ETCS ගිණුම) යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු එකතු කිරීමේ ගිණුමක් විවෘත කරනු ලැබිය යුතු ය.

(2) ඊ-ටැග් භාවිත කරන්නකු (E-tag user) ලෙස ලියාපදිංචි වීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම අධිකාරියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසුව ඊටීසීඑස් ගිණුමට (ETCS ගිණුමට) අදාළ තොරතුරු ද ඇතුළු ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති තොරතුරු පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව අධිකාරිය විසින්, එම තැනැත්තා ඊ-ටැග් භාවිත කරන්නෙකු (E-tag user) වශයෙන් ලියාපදිංචි කර මෙම නියෝගවල කාර්ය සඳහා එම තැනැත්තා වෙත ඊ-ටැග් (E-tag) උපාංගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) සෑම ඊ-ටැග් භාවිත කරන්නෙකු (E-tag user) විසින් ම ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු එකතු කිරීමේ පාරිභෝගික ගිවිසුමේ (මෙහි මින්මතු "ඊටීසීඑස් පාරිභෝගික ගිවිසුම"(ETCS පාරිභෝගික ගිවිසුම) යනුවෙන් සඳහන් කරනු ලබන) නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත්ව එම ගිවිසුමට ඇතුළත් විය යුතු ය.

(5) නිකුත් කරන ලද සෑම ඊ-ටැග් (E-tag) උපාංගයක් ම වාහනයේ ඉදිරිපස වීදුරුව මත සවිකර තිබිය යුතු ය.

(6) සෑම ඊ-ටැග් භාවිත කරන්නෙකු විසින් ම (E-tag user) (මෙහි මින්මතු "ඊටීසී මංතීරුව"(ETC මංතීරුව) යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු එකතු කිරීමේ මංතීරුවක් භාවිතා කරන සෑම අවස්ථාවක දී ම ඊටීසීඑස් ගිණුමේ (ETCS ගිණුමේ) ප්‍රමාණවත් හර ශේෂයක් පවත්වාගෙන යා යුතු ය.

(7) ඊටීසීඑස් ගිණුමේ (ETCS ගිණුමේ) ප්‍රමාණවත් මුදලක් නොපවතින අවස්ථාවක දී, ඊ-ටැග් භාවිත කරන්නෙකු (E-tag user) විසින්, එම ගිණුමට මුදල් හර කළ යුතු අතර, එසේ හර කරනු ලැබීම ඊ-ටැග් භාවිත කරන්නා (E-tag user) විසින් ඊටීසී මංතීරුව (ETC මංතීරුව) භාවිත කිරීමට පැය එකකට නොඅඩු කාලයක දී කළ යුතු ය.

(8) සෑම ඊ-ටැග් භාවිත කරන්නකු (E-tag user) එම ඊ-ටැග් (E-tag) උපාංග නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවතින බවට වගබලා ගත යුතු අතර, එම ඊ-ටැග් (E-tag) උපාංගයට සිදු වී ඇති යම් හානියක් හෝ එම ඊ-ටැග් උපාංගය (E-tag) නැති වී හෝ ඇති අවස්ථාවක දී ඒ පිළිබඳ වහාම අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය.

6. (1) ගාස්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් සහිතව යම් ඊ-ටැග් භාවිත කරන්නෙකු (E-tag user) යම් නම් කරන ලද ස්ථානයකින් හැර යම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවීමේ ජාතික මහා මාර්ගයකට ප්‍රවේශ වන අවස්ථාවක දී, එම ඊ-ටැග් භාවිත කරන්නාට (E-tag user) එම අන්තර් හුවමාරුවේ ඊටීසී මංතීරුව (ETC මංතීරුව) ඔස්සේ ඉදිරියට යාමට ඉඩ ලබා දිය යුතු ය.

(2) ඊ-ටැග් (E-tag) උපාංගයක් සවිකර ඇති යම් වාහනයක් ඊටීසී මංතීරුව (ETC මංතීරුව) භාවිතා කරන අවස්ථාවක දී, ඊටීසීඑස් ගිණුමට (ETCS ගිණුමට) එම ගාස්තු ස්වයංක්‍රීයව හරකරනු ලැබිය යුතු අතර, ඊ-ටැග් භාවිත කරන්නා (E-tag user) විසින් එම ගිණුම භාවිත කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රකාශනයක් ලබා ගත හැකි ය.

(3) ඊ-ටැග් භාවිත කරන්නෙකුට (E-tag user) ගාස්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් නොපවතින අවස්ථාවක දී, එම ඊ-ටැග් භාවිත කරන්නා (E-tag user) විසින් ස්වකීය වාහනය ඊටීසී මංතීරුවේ (ETC මංතීරුව) සිට අතින් මුදල් වශයෙන් ගාස්තු එකතු කරන මංතීරුව වෙත හරවනු ලැබිය යුතු ය.

7. (1) මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ජාතික මහා මාර්ගයේ අවශ්‍ය ස්ථානවල ප්‍රමාණවත් ගේට්ටු සංඛ්‍යාවක් සවිකර ඇති බවට අධිකාරිය වගබලා ගත යුතු ය.

(2) අධිකාරිය විසින්, එසේ ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සවිකරන ලද ගේට්ටුවල අයිතිය, පාලනය සහ නඩත්තුව දැරිය යුතු අතර, ඒ එක් එක් ගේට්ටුව අයකැමියකු විසින් හසුරුවනු ලැබිය යුතු ය.

(3) අයකැමි විසින්, (2) වන ඡේදයේ දක්වා ඇති සෑම ගේට්ටුවක දී ම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් භාවිත කරන සෑම රියදුරකුගෙන්ම මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත වූ ගාස්තු භාවිත කිරීමේ ගාස්තු වශයෙන් එකතු කර ගත යුතු යː

එසේ වුව ද, මෙම නියෝගවල උපලේඛනයේ "ආ" කොටසේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමෙන් බැහැර කොට ඇති වර්ගයක වාහනයක් පදවන රියදුරකු සම්බන්ධයෙන් මෙම නියෝගවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

8. අධිකාරිය විසින්, නිශ්චිතව සඳහන් කර ඇති යම් වේලාවන්හි දී, දිනය තුළ එකතු කළ ගාස්තු අයකැමි විසින් අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකු වෙත භාරදිය යුතු අතර, එසේ භාර දුන් මුදල් සම්බන්ධයෙන් කුවිතාන්සියක් ලබාගත යුතු ය.

9. ගාස්තු ලෙස එසේ එකතු කරගත් මුදල් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, මෙම නියෝග අදාළ වන ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග සංවර්ධනය කර පවත්වාගෙන යාමේ කාර්ය සඳහා එම මුදල් භාවිත කරනු ලැබිය යුතු ය.

10. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන වාහනයක රියදුරෙකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු -

(*අ*) පළමුවන වතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට; සහ

(*ආ*) දෙවන වතාවට හෝ ඊට පසුව සිදුවන වරදකරු කරනු ලැබීමක දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට,

යටත් විය යුතු ය.

11. මෙම නියෝගවල කාර්ය සඳහා -

"නම් කරන ලද ස්ථානය" යන්නෙන්, යම් වාහනයක රියදුරකු විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ පත්‍රයක් ලබා නොගෙන ප්‍රවේශ වීමට අවසර දෙනු ලබන ස්ථානයක් අදහස් වන අතර, එයට කැලණිය අන්තර් හුවමාරුව, පැලියගොඩ අන්තර් හුවමාරුව, කටුනායක අන්තර් හුවමාරුව සහ කටුනායක (කි. මී. 25.800) අදහස් වේ;

"ඊ-ටැග් (E-tag)" යන්නෙන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු ගෙවීමේ මංතීරුව පසු කිරීමේ දී ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු ගෙවීමේ කාර්ය සඳහා වාහනයේ ඉදිරිපස වීදුරුව මත ස්ථිරව සවිකරනු ලබන ඉලෙක්ට්‍රොනික උපාංගයක් අදහස් වේ;

"අයකැමි" යන්නෙන්, අන්තර් හුවමාරුවක හෝ නම් කරන ලද ස්ථානයක ගේට්ටු හසුරවනු ලබන නිලධරයකු අදහස් වේ;

"ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග" යන්නෙන්, ගාස්තු ගෙවිය යුතු දක්ෂිණ ජාතික මහා මාර්ගය කොට්ටාව (කි. මී. 0.000) සිට මත්තල (කි. මී. 200.451) දක්වා, ගාස්තු ගෙවිය යුතු අන්දරවැව - හම්බන්තොට ජාතික මහා මාර්ගය අන්දරවැව (කි. මී. 0.000) සිට හම්බන්තොට (කි. මී. 16.558) දක්වා, ගාස්තු ගෙවිය යුතු පිටත වටරවුම් ජාතික මහාමාර්ගය කොට්ටාව (කි. මී. 0.000) සිට කෙරවලපිටිය (කි. මී. 28.867) දක්වා සහ ගාස්තු ගෙවිය යුතු කොළඹ - කටුනායක ජාතික මහා මාර්ගය කොළඹ (කි. මී. 0.000) සිට කටුනායක (කි. මී. 25.800) දක්වා අදහස් වේ.

12. 2019 නොවැම්බර් මස 08 වන දිනැති අංක 2148/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2019 නොවැම්බර් මස 08 වන දිනැති අංක 2148/48 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජාතික මංමාවත් (භාවිත කිරීමේ ගාස්තු) නියෝග ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතිවිරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

උපලේඛනය (3 වන නියෝගය)

අ කොටස

1 වන වර්ගයට අයත් වාහන (ඇක්සල 2ක් සහ රෝද 4ක් ඇති වාහන) සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| දුර | කි.මී. | 8.7 කි.මී. | 7.3 කි.මී. | 6.7 කි.මී. | 16.5 කි.මී. | 9.35 කි.මී. | 4.8 කි.මී. | 5.1 කි.මී. | 6 කි.මී. | 8 කි.මී. | 21 කි.මී. | 11 කි.මී. | 22 කි.මී. | 12 කි.මී. | 16 කි.මී. | 12.4 කි.මී. | 7.9 කි.මී. | 9.9 කි.මී. | 11 කි.මී. | 15.5කි.මී. | 12.2කි.මී. | 9.1 කි.මී. | 7.1 කි.මී. | 10.3 කි.මී. | 10.5 කි.මී. | 20.7 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කටුනායක (පිටවීම - ඕ4) | ජා ඇල (පිටවීම - ඕ3) | කෙරවලපිටිය (පිටවීම - ඕ2) | පෑලියගොඩ (පිටවීම - ඕ1) | කඩවත (පිටවීම - සී4) | කඩුවෙල (පිටවීම - සී3) / කොතලාවල (පිටවීම - සී2) | අතුරුගිරිය (පිටවීම - සී1) | කොට්ටාව (පිටවීම -ඒ1) | කහතුඩුව (පිටවීම - ඒ2) | ගැලනිගම (පිටවීම - ඒ3) | දොඩන්ගොඩ (පිටවීම - ඒ4) | වැලිපැන්න (පිටවීම - ඒ5) | කුරුඳුගහහැක්ම (පිටවීම - ඒ6) | බද්දේගම (පිටවීම - ඒ7) | පින්නදූව (පිටවීම - ඒ8) | ඉමදූව (පිටවීම - ඒ9) | කොක්මාදුව (පිටවීම - ඒ10) | ගොඩගම (පිටවීම - ඒ11) | අපරැක්ක (පිටවීම - ඒ12) | බෙලිඅත්ත (පිටවීම - ඒ13) | කසාගල (පිටවීම - ඒ14) | අඟුණකොළපැලැස්ස (පිටවීම - ඒ15) | බරවාකුඹුක (පිටවීම - ඒ16) | සූරියවැව (පිටවීම - ඒ17) | මත්තල පිවිසුම (පිටවීම - ඒ18) | හම්බන්තොට පිවිසුම (පිටවීම - ඒ19) |
| ජා ඇල | 150 | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කෙරවලපිටිය | 100 | 50 | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| පෑලියගොඩ | 300 | 200 | 50 | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කඩවත | 200 | 150 | 100 | 150 | | | | | | | | | | | | | | | | | | | | | | |
| කඩුවෙල / කොතලාවල | 250 | 200 | 150 | 200 | 100 | | | | | | | | | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 300 | 250 | 200 | 250 | 150 | 100 | | | | | | | | | | | | | | | | | | | | |
| කොට්ටාව | 300 | 250 | 200 | 250 | 150 | 100 | 100 | | | | | | | | | | | | | | | | | | | |
| කහතුඩුව | 300 | 250 | 200 | 250 | 200 | 150 | 150 | 100 | | | | | | | | | | | | | | | | | | |
| ගැලනිගම | 350 | 300 | 250 | 300 | 200 | 200 | 150 | 150 | 100 | | | | | | | | | | | | | | | | | |
| දොඩන්ගොඩ | 400 | 350 | 300 | 350 | 300 | 250 | 250 | 200 | 150 | 150 | | | | | | | | | | | | | | | | |
| වැලිපැන්න | 450 | 400 | 350 | 400 | 300 | 300 | 250 | 250 | 200 | 200 | 100 | | | | | | | | | | | | | | | |
| කුරුඳුගහහැක්ම | 500 | 450 | 400 | 450 | 400 | 350 | 350 | 300 | 250 | 250 | 150 | 150 | | | | | | | | | | | | | | |
| බද්දේගම | 550 | 500 | 450 | 500 | 450 | 400 | 400 | 350 | 300 | 250 | 200 | 200 | 100 | | | | | | | | | | | | | |
| පින්නදූව | 600 | 550 | 500 | 550 | 500 | 450 | 450 | 400 | 350 | 300 | 250 | 250 | 150 | 150 | | | | | | | | | | | | |
| ඉමදූව | 650 | 600 | 550 | 600 | 550 | 500 | 500 | 450 | 400 | 350 | 300 | 300 | 250 | 200 | 100 | | | | | | | | | | | |
| කොක්මාදුව | 700 | 650 | 600 | 650 | 550 | 500 | 500 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | | | | | | | | | | |
| ගොඩගම | 700 | 650 | 600 | 650 | 600 | 550 | 550 | 500 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | | | | | | | | | |
| අපරැක්ක | 750 | 700 | 650 | 700 | 600 | 600 | 550 | 550 | 550 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | | | | | | | | |
| බෙලිඅත්ත | 800 | 750 | 700 | 750 | 650 | 650 | 650 | 600 | 600 | 550 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 200 | 150 | | | | | | | |
| කසාගල | 850 | 800 | 750 | 800 | 700 | 700 | 650 | 650 | 650 | 600 | 550 | 500 | 400 | 400 | 350 | 300 | 250 | 200 | 200 | 100 | | | | | | |
| අඟුණකොළපැලැස්ස | 850 | 800 | 750 | 800 | 750 | 700 | 700 | 700 | 650 | 650 | 550 | 550 | 450 | 400 | 350 | 300 | 300 | 250 | 200 | 150 | 150 | | | | | |
| බරවාකුඹුක | 900 | 850 | 800 | 850 | 750 | 750 | 700 | 700 | 700 | 650 | 600 | 550 | 500 | 450 | 400 | 350 | 300 | 300 | 250 | 200 | 150 | 100 | | | | |
| සූරියවැව | 950 | 900 | 850 | 900 | 800 | 750 | 750 | 750 | 700 | 700 | 600 | 600 | 500 | 450 | 400 | 400 | 350 | 300 | 300 | 250 | 200 | 150 | 150 | | | |
| මත්තල පිවිසුම | 950 | 900 | 850 | 900 | 850 | 800 | 800 | 750 | 750 | 750 | 650 | 600 | 550 | 500 | 450 | 400 | 400 | 350 | 300 | 250 | 200 | 200 | 150 | 150 | | |
| හම්බන්තොට පිවිසුම | 1000 | 950 | 900 | 950 | 900 | 850 | 850 | 800 | 800 | 750 | 700 | 650 | 600 | 550 | 500 | 450 | 450 | 400 | 350 | 300 | 250 | 250 | 200 | 200 | 150 | |

2 වන වර්ගයට අයත් වාහන (ඇක්සල 2ක් සහ රෝද 6ක් ඇති වාහන) සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| දුර | කි.මී. | 8.7 කි.මී. | 7.3 කි.මී. | 6.7 කි.මී. | 16.5 කි.මී. | 9.35 කි.මී. | 4.8 කි.මී. | 5.1 කි.මී. | 6 කි.මී. | 8 කි.මී. | 21 කි.මී. | 11 කි.මී. | 22 කි.මී. | 12 කි.මී. | 16 කි.මී. | 12.4 කි.මී. | 7.9 කි.මී. | 9.9 කි.මී. | 11 කි.මී. | 15.5කි.මී. | 12.2කි.මී. | 9.1 කි.මී. | 7.1 කි.මී. | 10.3 කි.මී. | 10.5 කි.මී. | 20.7 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කටුනායක (පිවිසුම - ඊ4) | ජා ඇල (පිවිසුම - ඊ3) | කෙරවලපිටිය (පිවිසුම - ඊ2) | පෑලියගොඩ (පිවිසුම - ඊ1) | කඩවත (පිවිසුම - සී4) | කඩුවෙල (පිවිසුම - සී3) / කොතලාවල (පිවිසුම - සී2) | අතුරුගිරිය (පිවිසුම - සී1) | කොට්ටාව (පිවිසුම -ඒ1) | කහතුඩුව (පිවිසුම - ඒ2) | ගැලනිගම (පිවිසුම - ඒ3) | දොඩන්ගොඩ (පිවිසුම - ඒ4) | වැලිපැන්න (පිවිසුම - ඒ5) | කුරුඳුගහහැතැක්ම (පිවිසුම - ඒ6) | බද්දේගම (පිවිසුම - ඒ7) | පින්නදූව (පිවිසුම - ඒ8) | ඉමදූව (පිවිසුම - ඒ9) | කොක්මාදූව (පිවිසුම - ඒ10) | ගොඩගම (පිවිසුම - ඒ11) | අපරැක්ක (පිවිසුම - ඒ12) | බෙලිඅත්ත (පිවිසුම - ඒ13) | කසාගල (පිවිසුම - ඒ14) | අඟුණකොළපැලැස්ස (පිවිසුම - ඒ15) | බරවකුඹුක (පිවිසුම - ඒ16) | සූරියවැව (පිවිසුම - ඒ17) | මත්තල පිවිසුම (පිවිසුම - ඒ18) | හම්බන්තොට පිවිසුම (පිවිසුම - ඒ19) |
| ජා ඇල | 300 | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කෙරවලපිටිය | 250 | 100 | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| පෑලියගොඩ | 450 | 350 | 100 | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කඩවත | 400 | 250 | 150 | 250 | | | | | | | | | | | | | | | | | | | | | | |
| කඩුවෙල / කොතලාවල | 450 | 300 | 200 | 300 | 150 | | | | | | | | | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 500 | 350 | 250 | 350 | 150 | 100 | | | | | | | | | | | | | | | | | | | | |
| කොට්ටාව | 550 | 400 | 300 | 400 | 200 | 150 | 150 | | | | | | | | | | | | | | | | | | | |
| කහතුඩුව | 550 | 400 | 300 | 400 | 250 | 200 | 150 | 150 | | | | | | | | | | | | | | | | | | |
| ගැලනිගම | 600 | 450 | 350 | 450 | 300 | 250 | 200 | 200 | 150 | | | | | | | | | | | | | | | | | |
| දොඩන්ගොඩ | 750 | 600 | 500 | 600 | 400 | 350 | 350 | 300 | 250 | 200 | | | | | | | | | | | | | | | | |
| වැලිපැන්න | 800 | 650 | 550 | 650 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 150 | | | | | | | | | | | | | | | |
| කුරුඳුගහහැතැක්ම | 950 | 800 | 700 | 800 | 600 | 550 | 550 | 500 | 450 | 400 | 300 | 250 | | | | | | | | | | | | | | |
| බද්දේගම | 1050 | 900 | 800 | 900 | 700 | 650 | 650 | 600 | 550 | 500 | 350 | 300 | 200 | | | | | | | | | | | | | |
| පින්නදූව | 1150 | 1000 | 900 | 1000 | 800 | 750 | 750 | 700 | 650 | 600 | 450 | 400 | 250 | 200 | | | | | | | | | | | | |
| ඉමදූව | 1200 | 1050 | 950 | 1050 | 900 | 850 | 800 | 800 | 750 | 700 | 550 | 500 | 350 | 300 | 150 | | | | | | | | | | | |
| කොක්මාදූව | 1250 | 1100 | 1000 | 1100 | 950 | 900 | 850 | 850 | 800 | 750 | 600 | 550 | 400 | 350 | 200 | 150 | | | | | | | | | | |
| ගොඩගම | 1350 | 1200 | 1100 | 1200 | 1000 | 950 | 950 | 900 | 850 | 800 | 700 | 600 | 450 | 400 | 300 | 200 | 150 | | | | | | | | | |
| අපරැක්ක | 1400 | 1250 | 1150 | 1250 | 1100 | 1050 | 1000 | 950 | 950 | 900 | 750 | 700 | 550 | 450 | 350 | 300 | 250 | 150 | | | | | | | | |
| බෙලිඅත්ත | 1500 | 1350 | 1250 | 1350 | 1200 | 1150 | 1100 | 1050 | 1050 | 1000 | 850 | 800 | 650 | 550 | 450 | 400 | 350 | 250 | 200 | | | | | | | |
| කසාගල | 1600 | 1450 | 1350 | 1450 | 1250 | 1200 | 1200 | 1150 | 1100 | 1050 | 950 | 850 | 700 | 650 | 550 | 450 | 400 | 350 | 250 | 150 | | | | | | |
| අඟුණකොළපැලැස්ස | 1650 | 1500 | 1400 | 1500 | 1350 | 1250 | 1250 | 1200 | 1150 | 1100 | 1000 | 900 | 750 | 700 | 600 | 500 | 450 | 400 | 350 | 250 | 150 | | | | | |
| බරවකුඹුක | 1700 | 1550 | 1450 | 1550 | 1400 | 1300 | 1300 | 1250 | 1200 | 1150 | 1050 | 950 | 800 | 750 | 650 | 550 | 500 | 450 | 400 | 300 | 200 | 150 | | | | |
| සූරියවැව | 1750 | 1600 | 1500 | 1600 | 1450 | 1400 | 1350 | 1300 | 1300 | 1250 | 1100 | 1000 | 900 | 800 | 700 | 650 | 600 | 500 | 450 | 350 | 250 | 200 | 150 | | | |
| මත්තල පිවිසුම | 1800 | 1650 | 1550 | 1650 | 1500 | 1450 | 1400 | 1400 | 1350 | 1300 | 1150 | 1100 | 950 | 850 | 800 | 700 | 650 | 600 | 500 | 400 | 350 | 300 | 250 | 150 | | |
| හම්බන්තොට පිවිසුම | 1900 | 1750 | 1650 | 1750 | 1600 | 1550 | 1500 | 1450 | 1450 | 1400 | 1250 | 1150 | 1050 | 950 | 850 | 800 | 750 | 650 | 600 | 500 | 400 | 350 | 300 | 250 | 250 | |

3 වන වර්ගයට අයත් වාහන (ඇක්සල 2කට වැඩි වාහන) සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| දුර | කි.මී. | 8.7 කි.මී. | 7.3 කි.මී. | 6.7 කි.මී. | 16.5 කි.මී. | 9.35 කි.මී. | 4.8 කි.මී. | 5.1 කි.මී. | 6 කි.මී. | 8 කි.මී. | 21 කි.මී. | 11 කි.මී. | 22 කි.මී. | 12 කි.මී. | 16 කි.මී. | 12.4 කි.මී. | 7.9 කි.මී. | 9.9 කි.මී. | 11 කි.මී. | 15.5කි.මී. | 12.2කි.මී. | 9.1 කි.මී. | 7.1 කි.මී. | 10.3 කි.මී. | 10.5 කි.මී. | 20.7 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කටුනායක (පිවිසුම - සී4) | ජා ඇල (පිවිසුම - සී3) | කෙරවලපිටිය (පිවිසුම - සී2) | පැලියගොඩ (පිවිසුම - සී1) | කඩවත (පිවිසුම - සී4) | කඩුවෙල (පිවිසුම - සී3) / කොතලාවල (පිවිසුම - සී2) | අතුරුගිරිය (පිවිසුම - සී1) | කොට්ටාව (පිවිසුම - ඊ1) | කහතුඩුව (පිවිසුම - ඊ2) | ගැලනිගම (පිවිසුම - ඊ3) | දොඩන්ගොඩ (පිවිසුම - ඊ4) | වැලිපැන්න (පිවිසුම - ඊ5) | කුරුඳුගහහැතැක්ම (පිවිසුම - ඊ6) | බද්දේගම (පිවිසුම - ඊ7) | පින්නදුව (පිවිසුම - ඊ8) | ඉමදූව (පිවිසුම - ඊ9) | කොක්මාදුව (පිවිසුම - ඊ10) | ගොඩගම (පිවිසුම - ඊ11) | අපරැක්ක (පිවිසුම - ඊ12) | බෙලිඅත්ත (පිවිසුම - ඊ13) | කසාගල (පිවිසුම - ඊ14) | අඟුණකොළපැලැස්ස (පිවිසුම - ඊ15) | බරවාකුඹුක (පිවිසුම - ඊ16) | සූරියවැව (පිවිසුම - ඊ17) | මත්තල පිවිසුම (පිවිසුම - ඊ18) | හම්බන්තොට පිවිසුම (පිවිසුම - ඊ19) |
| ජා ඇල | 300 | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කෙරවලපිටිය | 300 | 150 | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| පැලියගොඩ | 600 | 400 | 150 | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කඩවත | 500 | 350 | 200 | 350 | | | | | | | | | | | | | | | | | | | | | | |
| කඩුවෙල / කොතලාවල | 600 | 450 | 300 | 450 | 200 | | | | | | | | | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 650 | 500 | 350 | 500 | 250 | 150 | | | | | | | | | | | | | | | | | | | | |
| කොට්ටාව | 700 | 550 | 400 | 550 | 300 | 200 | 150 | | | | | | | | | | | | | | | | | | | |
| කහතුඩුව | 750 | 600 | 450 | 600 | 350 | 300 | 250 | 150 | | | | | | | | | | | | | | | | | | |
| ගැලනිගම | 850 | 700 | 550 | 700 | 450 | 350 | 300 | 250 | 200 | | | | | | | | | | | | | | | | | |
| දොඩන්ගොඩ | 1100 | 950 | 800 | 950 | 650 | 600 | 550 | 450 | 400 | 300 | | | | | | | | | | | | | | | | |
| වැලිපැන්න | 1250 | 1100 | 950 | 1100 | 800 | 750 | 650 | 600 | 500 | 450 | 250 | | | | | | | | | | | | | | | |
| කුරුඳුගහහැතැක්ම | 1500 | 1350 | 1200 | 1350 | 1050 | 1000 | 950 | 850 | 800 | 700 | 450 | 300 | | | | | | | | | | | | | | |
| බද්දේගම | 1650 | 1500 | 1350 | 1500 | 1200 | 1150 | 1100 | 1000 | 950 | 850 | 600 | 450 | 250 | | | | | | | | | | | | | |
| පින්නදුව | 1800 | 1650 | 1500 | 1650 | 1400 | 1300 | 1250 | 1200 | 1150 | 1050 | 750 | 650 | 350 | 250 | | | | | | | | | | | | |
| ඉමදූව | 1950 | 1800 | 1650 | 1800 | 1550 | 1450 | 1400 | 1350 | 1250 | 1200 | 900 | 800 | 500 | 350 | 200 | | | | | | | | | | | |
| කොක්මාදුව | 2050 | 1900 | 1750 | 1900 | 1650 | 1550 | 1500 | 1400 | 1350 | 1250 | 1000 | 850 | 600 | 450 | 250 | 200 | | | | | | | | | | |
| ගොඩගම | 2150 | 2000 | 1850 | 2000 | 1750 | 1650 | 1600 | 1550 | 1450 | 1400 | 1150 | 1000 | 750 | 600 | 400 | 250 | 200 | | | | | | | | | |
| අපරැක්ක | 2250 | 2100 | 1950 | 2100 | 1900 | 1800 | 1750 | 1650 | 1600 | 1500 | 1250 | 1150 | 900 | 750 | 550 | 450 | 350 | 250 | | | | | | | | |
| බෙලිඅත්ත | 2450 | 2300 | 2150 | 2300 | 2050 | 1950 | 1900 | 1850 | 1800 | 1700 | 1450 | 1300 | 1050 | 950 | 750 | 600 | 500 | 400 | 250 | | | | | | | |
| කසාගල | 2600 | 2450 | 2300 | 2450 | 2200 | 2100 | 2050 | 2000 | 1900 | 1850 | 1600 | 1450 | 1200 | 1050 | 900 | 750 | 650 | 550 | 400 | 200 | | | | | | |
| අඟුණකොළපැලැස්ස | 2700 | 2550 | 2400 | 2550 | 2300 | 2200 | 2150 | 2100 | 2050 | 1950 | 1700 | 1550 | 1300 | 1150 | 1000 | 850 | 750 | 650 | 550 | 350 | 200 | | | | | |
| බරවාකුඹුක | 2800 | 2650 | 2500 | 2650 | 2400 | 2300 | 2250 | 2200 | 2100 | 2000 | 1800 | 1650 | 1400 | 1250 | 1100 | 950 | 850 | 750 | 600 | 450 | 300 | 200 | | | | |
| සූරියවැව | 2900 | 2750 | 2600 | 2750 | 2500 | 2400 | 2350 | 2300 | 2250 | 2150 | 1900 | 1750 | 1500 | 1350 | 1200 | 1050 | 950 | 850 | 750 | 550 | 400 | 300 | 200 | | | |
| මත්තල පිවිසුම | 3000 | 2850 | 2700 | 2850 | 2650 | 2550 | 2500 | 2400 | 2350 | 2250 | 2000 | 1900 | 1650 | 1500 | 1300 | 1150 | 1100 | 950 | 850 | 650 | 550 | 400 | 350 | 200 | | |
| හම්බන්තොට පිවිසුම | 3150 | 3000 | 2850 | 3000 | 2800 | 2700 | 2600 | 2550 | 2500 | 2400 | 2150 | 2050 | 1800 | 1650 | 1450 | 1300 | 1250 | 1100 | 1000 | 800 | 650 | 550 | 500 | 350 | 350 | |

ආ කොටස

(7 වන නියෝගය)

**ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ග භාවිත කරන්නන් සඳහා වූ ගාස්තු ගෙවීමෙන් බැහැර කර ඇති වාහන**

1. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන ජනාධිපති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

2. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන අගමැති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.